
# දරුවාගේ මනස



දෙමව්පියෝ සිය ජීවිත කාලයෙන් වැඩි කොටසක් තම දරුවන්ට ආහාර පාන, ඇඳුම්, පැලඳුම් හා අධ්‍යාපනය තමාට හැකිතරමින් ලබාදෙන අතර, ඔවුන්ගේ අනාගතාභිවෘද්ධිය කෙරෙහි නිතරම සැලකිලිමත් වෙති. තම දූ දරුවන්ගේ අනාගතය දීප්තිමත් කිරීමේ චේතනාවෙන් කටයුතු කරණ දෙමව්පියන් මීට වඩා වැදගත් කරුණක් කෙරෙහි සිය අවධානය යොමු කළ යුතුය. ඒ තම දරුවන්ගේ ගති පැවතුම් හා ක්‍රියා කලාපයයි. නිරවුල් නිරෝගි සිත අනුව දරුවාගේ අනාගතය බොහෝ දුරට හැඩගැසෙන බැව් නොදත්කම නිසා දරුවාගේ චෛතසික පැවැත්ම කෙරෙහි සැලකිළිමත් වන දෙමව්පියන් අද සමාජයේ බෙහෙවින් අඩුය.

දරුවාගේ වයස අවුරුදු 10 පමණ වනතුරු හේ විශේෂයෙන්ම මවගේ උණුසුම් ආදරය, කරුණාව හා අනුකම්පාව නොඅඩුව ලැබීම, පිරිසිදු මනසක් ඇතිකිරීමට මූලික වශයෙන් ඉවහල්වේ. එසේ නොවූ කල දරුවාගේ ළපටි සිත නොයෙකුත් දේවල් කෙරෙහි අරමුණක් නැතිව දිවෙන්නට පිළිවන. මවක් තම දරුවාට හැකි සෑම සැපතක්ම ලබාදීමට බලා පොරොත්තුවෙයි. සෑම යත්නයක්ම දරයි. එහෙත් අද සමාජ තත්ත්වය අනුව බොහෝ තරුණ මව්වරුන්ගෙන් මෙම යුතුකම හරියාකාර ඉටු නොවේ. එය දරුවා ගැන නොසලකා හැරීමක් හෝ යුතුකම් පැහැර හැරීමක් නොවේ. රැකියාවල යෙදීම, සමාජ කටයුතුවල නිතරවීම හා පෝෂ්‍ය කළහැකි ප්‍රමාණයට වඩා දරුවන් සිටීම ආදී කරුණු හේතුකොට ගෙන මෙය නිරායාසයෙන්ම සිදුවේ. එතෙකුදු වුවත් සිය දරුවන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැර හැරීම වාසනාවත් දරු පරපුරක් ඇතිකිරීමේ අපේක්ෂාවට තර්ජනයකි.

**දරුවාගේ සිත වැඩෙන මේ අවධියේ ඔහු හෝ ඇය කෙරෙහි මව දක්වන ආදරය ඔවුන්ගේ ජීවිත කාලය මුලුල්ලේම සිතින් නොමැකේ. දරුවාගේ මාතෘ ප්‍රේමය පෙරලා ලැබෙන්නේද ඒ ආදරය හා හැඩගැසීම අනුවය. සිය දරුවන් කෙරෙහි ඒ හා සමානම ආදරයක් දැක්වීමට මෙය බොහෝදුරට ඉව**

හල්වේ. ඊළඟට තම මව තම සහෝදර සහෝදරියන්ටත් පියාටත් සලකන අන්දම, දක්වන ආදරය කෙරෙහිද කුඩා දරුවාගේ අවධානය යොමුවේ. දරුවාගේ ආදරය ඔවුන් කෙරෙහි යොමුවන්නේද ඒ අනුවය.

පියාගේ මඟපෙන්වීම අවබෝධ කරගන්නා තුරු දරුවා සම්පූර්ණ උණුසුම් ආදරය, සෙනෙහස, කරුණාව, හා අනුකම්පාව බලා පොරොත්තු වන්නේ මවගෙනි. මවගෙන් ලැබෙන ආදරය මිහිපිට වෙනත් කිසිවෙකු ගෙන් දරුවාට නොලැබේ. මවගේ අකල් මරණය වැනි නොවැලැක්විය හැකි හේතූන් නිසා මවගේ සෙනෙහස නොලබන දරුවෙකුට ආදරය දක්වන කෙනෙකු නැතිකල ඔහු නිතර මානසික ඌනතාවයකින් පෙළෙන්නට පටන් ගනී. ආදරය යනු කුමක්දැයි ඒ දරුවාට තේරුම් නොයයි. එහෙත් ආදරය යනු වෙන් යමක් ඇති බවත් එය තමාට අහිමි වී ඇති බවත් ටිකින් ටික ඔහුට හෝ ඇය වැටහේ. අනෙක් දරුවන්ට සිය මව්වරුන්ගේ ආදරය ලැබෙන හැටි දක්නා දරුවා මානසික වශයෙන් පීඩාවට පත්වේ. වයසින් මුහුකුරායත්ම නොහික්මුණු පුද්ගලයෙකු වේ.

මේ අනුව මවගේ උණුසුම් ආදරය ලැබ වැඩෙන දරුවා විනීත, හික්මුණු, වාසනාවත් අනාගතයක් ඇති හොඳ පුරවැසියෙකු වන අතර, මෙය නොලබන දරුවා අවිනීත, නොහික්මුණු, අවාසනාවත් නරක පුරවැසියෙකු වේ. ඔබේ දරුවා මෙහි මුලින් සඳහන් ගණයේ පුරවැසියෙකු වනු දක්නට කැමැති සැම මවක්ම නිර්මල ආදරයක් දක්වමින් තම දරුවා හදා වඩා ගැනීම මැනවි. එවිට ඔබේ දරුවා නිතැතින්ම සමාජයේ උසස් තැනක් ගන්නා රටට, ජාතියට, ආගමට, වැඩදායි මනුෂ්‍යයෙකු වනු නොඅනුමානය.

## ළමයින්ගේ වයස සොයන්න

සිල්වා මහතාට ළමයින් හතරදෙනෙකු සිටී. බාල ළමයා මෙන් දෙගුණයක් වැඩිමල් ළමයා වයසය. ළමයින් හතරදෙනාගේම වයස එකතුකොට බාල ළමයා ගේ වයසින් බෙදූවිට ලැබෙන්නේද වැඩිමල් ළමයාගේ වයස ප්‍රමාණයමවේ.

වැඩිමහල් ළමයාට අවුරුද්දකට පසුව දෙවැනි ළමයාද, බාල ළමයාට අවුරුද්දකට ප්‍රථම තුන්වැනි ළමයාද ඉපදී ඇත. ළමයින් හතර දෙනාගේ වයස වෙන් වෙන් වශයෙන් දක්වන්න.

පිළිතුර :—

අවුරුදු 6, අවුරුදු 5, අවුරුදු 4 හා අවුරුදු 3 ත්‍ය.